# 11 ශ්‍රේණිය - පිළිතුරු

## පාඩම - 18 හෙළ බොදු කලාවේ අසිරිය

1. ■ බෝධිය, වජ්‍රාසනය, පද්මය, සිරිපතුල,ධර්ම චක්‍රය, ස්තූපය

2. ■ ආබද්ධ පිළිම - පිළිමයට පිටු පසින් ගලක් හෝ වෙනත් බාහිර ආධාරකයක් ඇති ව නිමවා ඇති පිළිම - ප්‍රසිද්ධ අවුකන බුද්ධ ප්‍රතිමාව

■ අනාබද්ධ පිළිම - ආධාරකයක් නොමැති ව නිමවා ඇති පිළිම - මාළිගාවෙල බුදු පිළිමය

3. 1. ධ්‍යාන මුද්‍රාව

හිඳි පිළිමවල බොහෝවිට දක්නට ඇත. වම් අත්ල මත දකුණු අත්ල පිහිටුවා තිබීමෙන් මෙම මුද්‍රාව අර්ථවත් කෙරේ. මෙයින් භාවනානුයෝගී සමාධිගත ඉරියව්ව සංකේතවත් කෙරේ.

උදාහරණ - අනුරාධපුරයේ ප්‍රසිද්ධ සමාධි පිළිමය

2. අභය මුද්‍රාව

දකුණු අත උඩට නමා ඇඟිලි සම්පූර්ණයෙන් ම දිග හැර අත්ල ඉදිරියට සිටින සේ නිරූපණය කෙරෙන්නේ අභය මුද්‍රාවයි. ලෝක සත්ත්වයාට උරුම ව ඇති සසර බිය දුරු කිරීම මෙයින් පිළිබිඹු කරන බව විද්වත් මතයයි.

උදාහරණ - අවුකන ප්‍රතිමාව හා ගල් විහාර ප්‍රතිමාව

3. විතර්ක මුද්‍රාව

දකුණු අත උඩට නමා දබර ඇඟිල්ල මාපට ඇඟිල්ලේ තුඩ මත තබා කවයක් ලෙස ඇඟිලි දෙක සකසා තිබීම මෙහි විශේෂ ලක්ෂණයයි. මෙමගින් ගැටලු විසඳීමට බුදුරදුන්ගේ යොමු වීම සංකේතවත් කෙරේ.

4. ධර්ම චක්‍ර මුද්‍රාව

ධර්ම චක්‍ර මුද්‍රාව සඳහා අත් දෙක ම භාවිත කෙරේ. පළමු ව දකුණු අත්ල පිටතට හරවා එය පපුවේ මට්ටමට ගෙන එම අතේ මහපට ඇඟිල්ලේ හා දබර ඇඟිල්ලේ තුඩු දෙක ස්පර්ශ වන අයුරින් කවයක් සෑදෙන ලෙස එකට තබාගෙන ඇත. අනතුරුව පපුව ප්‍රදේශයට හැරුණු වම් අතේ ඇඟිල්ලක් ස්පර්ශ කරන අයුරින් නිරූපිත මුද්‍රාව ධර්ම චක්‍ර මුද්‍රාව වේ. මෙයින් ධර්මය පැහැදිලි කිරීම පෙන්නුම් කෙරේ.

5. භූමි ස්පර්ශ මුද්‍රාව

මෙය හිඳි පිළිමවලට පමණක් ආවේණික මුද්‍රාවකි. හිඳි පිළිමයේ දකුණු දණ හිසට උඩින් තම දකුණු අත්ල ඇතුළට සිටින සේ ඇඟිලි දිග හැර පහතට සිටින ආකාරයට මූර්තිමත් කෙරේ. වම් අත භාවනානුයෝගී ඉරියව්වෙන් තබා ඇත. මෙයින් බුදුරදුන් මාර පරාජයේ දී පොළොව සාක්ෂි දැරීම සංකේතවත් කෙරේ.

6. වරද මුද්‍රාව

බොහෝ විට මෙය හිඳි පිළිමවල දැකිය හැකි මුද්‍රාවකි. දකුණු අත පහත් කොට අත්ල උඩු අතට හරවා ඇඟිලි දිගහැර තිබීම මෙම මුද්‍රාවේ ලක්ෂණයයි. වරදානය මේ තුළින් සංකේතවත් කෙරේ.



සැකසුම - වයි. පී. පී කවිසිගමුව
ගුරු උපදේශිකා, කලාප අධ්‍යාපන කාර්යාලය, රත්නපුර

4\. 1. වීරාසනය

වාඩි වී සිටින විට වම් පාදය දකුණු පාදයට යටින් හා දකුණු පාදය වම් පාදයට උඩින් පිහිටන ලෙස තබා හිඳගෙන සිටින ඉරියව්ව වීරාසනයයි.

2\. භද්‍රාසනය

භද්‍ර යන්නෙන් යහපත් බව, සුබ බව අර්ථවත් වේ. එබඳු යහපත් වූ සුබ වූ ආසනය භද්‍රාසනයයි. මදක් උස් වූ ආසනයක හිඳගෙන කලවා දෙපසට විහිදුවා පාද පහළින් ඇති පද්මයක් වැනි පීඨයක් මත තබාගෙන සිටීම එම ආසනයේ ස්වභාවයයි.

3\. පද්මාසනය

අර්ථයට අනුකූල ව පද්මයක ආකාරයට හිඳගෙන සිටීම මෙම ආසනයේ ලක්ෂණයයි. දණහිස් නමා පතුල් උඩ අතට සිටින සේ වම් පතුල දකුණු කලවා මත ද දකුණු පතුල වම් කලවා මත ද තබාගෙන සිටින ඉරියව්ව පද්මාසනය නම් වේ.

5\. ■ ප්‍රතිමාඝර ප්‍රධාන වර්ග තුනකි. එනම්

1\. ගන්ධ කුටි

2\. පාසාද

3\. ගෙඩිගේ වශයෙනි.

1\. ගන්ධ කුටි

බුදුරජාණන් වහන්සේ වැඩ විසූ කුටිය ගන්ධ කුඨය ලෙස හැඳින්විණි. මුල් ම ප්‍රතිමාඝර සඳහා මෙම නම යොදන්නට ඇත්තේ එම අර්ථයෙනි. මෙය සරල ප්‍රතිමාඝර විශේෂයකි. කිරිබත් වෙහෙර, තොළුවිල, පන්කුළිය යන ස්ථානවල මෙබඳු ප්‍රතිමාඝර පැවැති බව සැලකේ.

2\. පාසාද

මෙය තරමක් විශාල මහල් සහිත ගොඩනැගිල්ලක් බව වචනාර්ථයෙන් ම පැහැදිලි ය. මිගාර මාතු පාසාද සංකල්පය අනුව යමින් මෙය නිර්මාණය කරන්නට ඇතැයි සැලකේ. රත්න ප්‍රාසාද ගොඩනැගිල්ල, බිසෝ මාළිගා ගොඩනැගිල්ල යන ස්ථානවලින් මෙයට අදාළ ආකෘති හමුවේ.

3\. ගෙඩිගේ

මෙය ප්‍රමාණයෙන් විශාල වූ පිළිම ගෙවල් විශේෂයකි. මෙහි වහලය පවා ගඩොලින් නිමවා ඇත. අනුරාධපුර යුගයේ අවසාන භාගයේ පටන් ගෙඩිගේ ක්‍රමයේ පිළිම ගෙවල් නිර්මාණය කිරීම සිදු ව ඇත. දැනට ශේෂ ව ඇති මෙබඳු හැඩයෙන් යුතු ප්‍රතිමාඝර කිහිපයක් පොළොන්නරුවෙන් හමුවේ. මහ පැරකුම්බා රජු විසින් කරන ලදැ යි සැලකෙන ථූපාරාම පිළිමගෙය, තිවංක පිළිමගෙය, ලංකාතිලක පිළිමගෙය, ප්‍රසිද්ධ නාලන්දා ගෙඩි ගෙය මෙයට අයත් ය.



සැකසුම - වයි. පී. පී කවිසිගමුව
ගුරු උපදේශිකා, කලාප අධ්‍යාපන කාර්යාලය, රත්නපුර

6. ■ දෙගල් දොරුව විහාරය

■ මැදවල විහාරය

■ රන්ගිරි දඹුළු විහාරය

■ කුරුණෑගලට සමීප ව ඇති රිදී විහාරය

■ බඹරගල විහාරය

■ කැලණියේ පැරණි විහාර මන්දිරය

7. ■ දෙවරගම්පොළ සිල්වත් තැන

■ හිරියාලෙ නයිදෙ

■ දේවේන්ද්‍ර මූලාචාරියා

8. ■ චිත්‍ර ඇඳීමේ දී රේඛා කර්මය හා වර්ණ පූර්ණය යන අංග දෙකින් යුතු ව එය සිදුකර ඇත. එනම් පළමුවෙන් රූපවල බාහිර රේඛා ඇඳ අනතුරුව වර්ණ යොදා රූපය සම්පූර්ණ කිරීමයි.

■ රතු, සුදු, කහ, කළු යන වර්ණ වැඩි වශයෙනුත් නිල් සහ කොළ පාට අඩුවෙනුත් යොදාගෙන ඇත.

■ කහ සහ සුදු පාටින් ඇඳි සිතුවම් රතු පසුබිමක දක්නට ලැබේ.

■ මිනිස් රූප, සත්ත්ව රූප හා ගස් වර්ග ස්වාභාවික පරිසරයේ පවත්නා ආකාරයෙන් ම ඇඳීම මේ යුගයේ සම්ප්‍රදාය නොවී ය. අඳින ලද එම රූප සැබෑ මනුෂ්‍ය හා සත්ත්වයින්ගේ භෞතික ශරීරයට අනුගත නොවේ. අඟපසඟ ද ශරීර පරිමානුකූල ව නිමවා නැත. මිනිස් රූපවල මුහුණෙන් හෝ අත් සහ ඇඟිලිවලින් අදහස් ප්‍රකාශ කිරීමට උත්සාහ ගත් බවක් ද දැකිය නොහැකි ය. ගැහැනු හා පිරිමි රූප සිත්කලු ලෙස ඇඳ රසිකයින් ආකර්ෂණය කර ගැනීමට ද සමත් නොවේ.

■ එළිය අඳුර දැක්වීම හෝ පර්යාවලෝකය (ළඟ සහ ඈත වස්තු පෙනෙන ආකාරය) දැක්වීම ද සිදු කර නැත.

■ අඛණ්ඩ කථන ක්‍රමයට සිතුවම් ඇඳීම මේ යුගයේ ජනප්‍රිය වී ඇත. එනම් කිසි යම් කතා පුවතක එක් චිත්‍ර රාමුවක් නොව ඒ හා සම්බන්ධ සිදුවීම් පෙළක් නිරූපණය කිරීමයි.

9. ■ රිචඩ් හෙන්රිකස්

■ එම්. සාර්ලිස්

■ සෝලියස් මෙන්දිස්

■ ජෝර්ජ් කීට්

■ ඇල්බට් ධර්මසිරි

■ සෝමබන්දු විද්‍යාපති

10. ■ ඇල්බට් ධර්මසිරි මහතා

11. ■ ජෝර්ජ් කීට් මහතා

12. ■ කැලණි විහාරයේ අලුත් විහාර මන්දිරය

■ මාවිල සුමන කුසුමාරාමය

■ රණස්ගල්ල විහාරය

■ මැද්දෙපොල විහාරය